*සැ. යු.-* 2019.04.12 දින පළ වූ අංක 2,119 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,120 - 2019 අප්‍රේල් මස 18 වැනි සිකුරාදා - 2019.04.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 880 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 10 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අප්‍රේල් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් මාර්ග හා කර්මාන්ත අමාත්‍යාංශය**

බස්නාහිර පළාත

පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර, සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නඩත්තු කාර්මික ශිල්පීය තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම

පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නඩත්තු කාර්මික ශිල්පී තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

*පුරප්පාඩු සංඛ්‍යාව - 01*

1. *සේවා කොන්දේසි :*

1.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.)

1.2 තෝරාගනු ලබන අපේක්ෂකයන් වර්ෂ තුනක පරිවාස කාලයකට යටත් විය යුතුය.

1.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, අනුව කටයුතු කළ යුතුය.

1.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස රා.ප.ච. 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

2. *වැටුප් පරිමාණය, වයස් සීමාව.-*

2.1 *වාර්ෂික ඒකාබද්ධ වැටුප* - (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL-2-2016)

2.2 *වැටුප් පරිමාණය* - රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450

2.3 *වයස් සීමාව* - 2019.05.18 දිනට,

අවම වයස - අවුරුදු 18

උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

3. *බඳවා ගැනීමේ සුදුසුකම්.-*

3.1 *අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. (එක් වරක දී අවම වශයෙන් විෂයන් පහක් (05) සමත් වී තිබිය යුතුය.

3.2 *වෘත්තීය සුදුසුකම් :*

විදුලි කාර්මික ශිල්පය පිළිබඳ NVQ දෙවන (02) මට්ටම ලබා තිබීම (පිළිගත් සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)

3.3 *පළපුරුද්ද :*

ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ආයතනයක යන්ත්‍ර හා විදුලි නඩත්තු පිළිබඳ අවුරුදු 01ක පළපුරුද්දක් තිබීම හා විදුලි නඩත්තු, පැස්සුම්, වෑද්දුම්, වායු සමීකරණ, යන්ත්‍ර නඩත්තු, ජල නල කාර්මික පිළිබඳ සාමාන්‍ය දැනුමක් තිබීම විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

4. *වෙනත් සුදුසුකම් :*

4.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

4.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වර්ෂ තුනක කාලයක් බස්නාහිර පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

4.3 අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

4.4 බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

5.1 *ලිඛිත විභාගය :*

පහත සඳහන් විෂයයන් යටතේ තරග විභාගය පවත්වනු ලැබේ :-

| *අනු. අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | විෂයානුබද්ධ දැනුම - (ප්‍රශ්න 50 කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.) | පැය 01 | 100 | 40% |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය - (ප්‍රශ්න 50 කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි) | පැය 01 | 100 | 40% |

5.2 *විභාගය සඳහා වන විෂය නිර්දේශය :*

| *අනු. අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | විෂයානුබද්ධ දැනුම | 1. විදුලි විද්‍යා මූලධර්ම<br>* විදුලි ඒකක සහ ගණනය කිරීම<br>* විදුලි සංකේත<br>* විදුලි මෝටර්වල ක්‍රියාකාරීත්වය<br>* වායු පැස්සුම් ක්‍රියාකාරීත්වය<br>* වායු සමීකරණ දැනුම |

| *අනු. අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | විෂයානුබද්ධ දැනුම | 2. ගොඩනැගිලි විදුලි ස්ථාපනය<br><br>* විවිධ පථ වර්ග<br>* තට්ටු ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය<br>* නිවාසවල විදුලි ස්ථාපනය<br>* නූල් අඟල් අඩි සහ මෙට්‍රික් පරිමාණ<br>* කර්මාන්ත ශාලාවල විදුලි ස්ථාපනය<br>* රැහැන් අදින ක්‍රම (තාවකාලික විදුලි පරිපථවල ස්ථිර විදුලි පරිපථවල කොන්ක්‍රීට් මත ලී භුගත රැහැන් ඇදීම)<br><br>3. තෙකලා විදුලිය<br><br>* තෙකලා විදුලි රැහැන් සම්බන්ධ කරන ආකාරය<br>* භාවිතා කරන උපාංග (විදුලි මීටරය වහරු ආදිය)<br>* තෙකලා විදුලිය භාවිතා වන උපකරණ<br><br>4. අනෙකුත්<br><br>* පැස්සුම් ට්‍රාන්ස්ෆෝමර්<br>* ලියවන පට්ටල්<br>* බහුකාර්ය දැව සකසන ලද යන්ත්‍රවල යාන්ත්‍රික හා විදුලි නඩත්තු පිළිබඳ දැනුම<br>ගොඩනැගිලි ඇතුළත සකස් කිරීම (Partitions) අභ්‍යන්තර දුරකථන පද්ධති හා පරිශ්‍ර සුළු නඩත්තු අලුත්වැඩියා ජලනල එලීම හා ජල සැපයුම් පද්ධති නඩත්තු පිළිබඳ දැනුම |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයා සතු කරුණු නිවැරදි සහ තර්කානුකූල ලෙස අවබෝධ කර ගැනීමේ බුද්ධිමය හා ගණිතමය හැකියාව මැන බැලීම. |

6. *විභාග ගාස්තු :*

6.1 රු. 600 කි. විභාග ගාස්තු බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බප 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. මෙසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කවර හෝ කරුණක් නිසා විභාග යට පෙනී නොසිටින හෝ අයදුම්පත් ඉවත් කර ගන්නා අයදුම්කරුවන්ට හා විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොමැති බව හෙළිවන අයදුම්කරුවන්ට විභාග ගාස්තු සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද, මෙම විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙනත් විභාගයක් වෙනුවෙන් පැවරීමට ද නොහැකිය.

7. *විශේෂ කරුණු :*

අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත්, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

8. *අයදුම්පත් එවනු ලබන පිළිවෙල :*

අයදුම්කරුවන් විසින් මේ සමග අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක තනිපිටුව භාවිතා කරමින් පිළියෙල කළ අයදුම්පත් **2019.05.18** දිනට පෙර **''ලේකම්, පළාත් මාර්ග ප්‍රවාහන අමාත්‍යාංශය, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල''** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. අයදුම්පත් ලැබුණු බවක් දන්වා එවනු නොලැබේ.

9. රජයේ විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් අත්සන සහතික කරනු ලැබ තිබිය යුතුය.

කේ. චම්පා එන්. පෙරේරා,
ලේකම්,
පළාත් මාර්ග හා කර්මාන්ත අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

### ආදර්ශ අයදුම්පත

*පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කාර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නඩත්තු කාර්මික ශිල්පීය තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2019*

| .......................... |
|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :——————.

   (ii) සම්පූර්ණ නම :——————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

3. ස්ථිර ලිපිනය හා දුරකථන අංකය :——————.

   (i) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාල කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

   කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

   (ii) 2019.05.18 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

   අවු. :—————, මාස :—————, දින :—————.

   (iii) දුරකථන අංකය - පෞද්ගලික :—————, රාජකාරි :—————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාල කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

   ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

5. විවාහක/අවිවාහක බව : විවාහක : ☐ අවිවාහක : ☐

6. උපන් දිනය :—————.

   (i) 2019.05.18 දිනට වයස : අවු. :—————, මාස :—————, දින :—————.

   (ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද?/ලියාපදිංචියෙන් ද? :——————.

7. *අධ්‍යාපන සුදුසුකම් :*

*අ.පො.ස. (සා/පෙළ) :*

වර්ෂය :————. විභාග අංකය :————. වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂය* | *ලබා ඇති සාමාර්ථය* | *විෂය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 1. | |
| 2. | | 2. | |
| 3. | | 3. | |
| 4. | | 4. | |
| 5. | | 5. | |
| 6. | | 6. | |
| 7. | | 7. | |
| 8. | | 8. | |

8. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :————.

9. ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවය අවසන් කරනු ලැබීමට ද යටත්වන බව ද දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. *අයදුම්කරුගේ අත්සන සනාථ කිරීම (අනවශ්‍ය වචන කපා හරින්න.)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන....................................................... මයා මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු.................................දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 240,360ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් අත්සන සහතික කරනු ලැබ තිබිය යුතුය.)

04-653

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.